**පෝරතිව් පත්තු ප්‍රාදේශීය සභාව**
**මඩකලපුව දිස්ත්‍රික්කය**
**------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 05 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 30 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුනි 19 දින ද සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට පෝරතිව් පත්තු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පළාත් භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවෙන් අයකළ යුතු මුද්දර ගාස්තු රු. 6,986,412 ක් ලෙස තක්සේරු කර තිබූ නමුත්, හිඟ මුද්දර ගාස්තු ලෙස මෙම වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | ලැබිය යුතු ආදායම් ගිණුම්ගත කළ යුතුවේ. | මුද්දර ගාස්තු ලෙස ගණනය කළ රු. 6,986,412 වැරදීමකින් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය නොහැකි විය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ, 2017 හා 2018 වර්ෂයට අදාළ මුද්දර ගාස්තු රු.7,523,697 කින් නැගෙනහිර පළාත් භාණ්ඩාගාරයෙන් පරිපාලන වියදම් ලෙස අයකළ 1% ක් හෙවත් රු. 75,237 ක් ද මඩකලපුව සහ කල්මුණෙහි පිහිටි දිස්ත්‍රික් සහකාර ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල්ට ගෙවා තිබූ මුදල් ද ගිණුම්වල දක්වා නොතිබුණි. | මුළුමනින්ම ඉපැයූ ආදායම් හා ඒ සම්බන්ධ වියදම් සන්සන්දනය කර ලාභය ගණනය කළ යුතුවේ. | මඩකලපුව හා කල්මුණේ හි පිහිටි දිස්ත්‍රික් සහකාර ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට ගෙවූ මුදල් වැරදීමකින් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය නොහැකි විය. |
| (ඇ) | සභාව සතු ඉඩම් 10 ක් අයිතිය තහවුරු කිරීම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් මැනීම සඳහා මැනුම් ගාස්තු රු. 745,954 ක් මූල්‍ය ප්‍රකාශනවල පුනරාවර්තන වියදම් ලෙස දක්වා තිබුණි. | මැනුම් ගාස්තු වනාහි ඉඩම් සම්බන්ධ මූලධන වියදමකි. | ඉඩම්වල අයිතිය තහවුරු කිරීම සඳහා මැනුම් ගාස්තු රු. 745,954ක් ඉදිරියේදි ඉඩම් හා ගොඩනැගිලි ගිණුමෙහි දක්වනු ලැබේ. |

### 1.3.2 ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **ගෙවිය යුතු ගිණුම්**<br>වියදම් ණයහිමියන් රු. 143,847 ක් වර්ෂ 07 කට අධික කාලයක සිට නිරවුල් නොකර පැවතුණි. | වියදම් ණය හිමියන් ලෙස දැක්වුවහොත් එය ඉදිරි වර්ෂයේදි නිරවුල් කළ යුතු වේ. | වියදම් ණයහිමි ගිණුමේ දක්වා ඇති රු. 143,847 ක වටිනාකම සහා තීරණය මත නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. |

### 1.3.3 ලේඛනගත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| රු. 221,494,485 ක් වූ ගිණුම් විෂය 05 ක් ඉඩම් ඔප්පු, වත්කම් ලේඛන හා අයිතිය තහවුරු කිරීමේ ලේඛන ආදිය ඉදිරිපත් නොකිරීම නිසා ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකිවිය. | අයිතිය තහවුරු කිරීමේ ලේඛන ඉදිරිපත් කළ යුතුවේ. | මුලාා ප්‍රකාශනවල දක්වා ඇති ඉඩම් හා ගොඩනැගිලිවල අයිතිය තහවුරු කිරීමේ කටයුතු ප්‍රාදේශීය ලේකම් මාර්ගයෙන් සිදුකර ඇත. තවද, යන්ත්‍රෝපකරණ හා මෝටර් රථ හා කරත්ත අයිතිය තහවුරු කිරීමේ ලේඛන පවතී. පිටපත් අමුණා ඇත. තවද, ඉදිරි කාලයේදි වත්කම් ලේඛනයේ ලේඛනගත කිරීමට කටයුතු කෙරේ. |

### 1.4 අනුකූල නොවීම්

**නිතී, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නිතී, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| | නිතී, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- | --- |
| (අ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන හා කලමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය | වාහන සඳහා ඉන්ධන දහන පරික්ෂාවක් කර නොතිබුණි. | වාහන සඳහා ඉන්ධන දහන පරික්ෂාවක් සිදුකළ යුතුවේ. | වාහන සඳහා ඉන්ධන දහන පරීක්ෂාව සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| (ආ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | කාර්ය මණ්ඩලය සඳහා මානව සම්පත් සැලැස්මක් සකස් කර නොතිබුණි. | කාර්ය මණ්ඩලය සඳහා මානව සම්පත් සැලැස්මක් සකස් කළ යුතුවේ. | කාර්ය මණ්ඩලය සඳහා මානව සම්පත් සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 3,196,766ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු. 78,699 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලොචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම් | බිල් කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල් කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,100,000 | - | 10,450 | - | 1,100,000 | -- | -- | -- |
| කුලී | 3,930,000 | 3,217,431 | 3,132,831 | 84,600 | 3,981,165 | 2,860,791 | 2,852,381 | 50,500 |
| බලපත්‍ර ගාස්තු | 2,000,000 | 1,707,506 | 1,707,506 | - | 2,400,000 | 985,095 | 985,095 | -- |
| අනෙකුත් ආදායම් | 11,370,000 | 12,339,118 | 12,340,587 | - | 11,325,000 | 6,075,197 | 6,076,148 | 17,898 |
| එකතුව | 18,400,000 | 17,264,035 | 17,191,374 | 84,600 | 18,806,165 | 9,921,083 | 9,886,624 | 68,398 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් සමාලෝචිත වර්ෂයේ නව ආදායම් මූලාශ්‍ර හඳුනාගෙන ආදායම් වැඩි කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආදායම් මූලාශ්‍ර වැඩි වශයෙන් පැවතුණද, ඒවා හඳුනාගෙන අයකිරීමට කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේ නව ආදායම් මූලාශ්‍ර හඳුනාගෙන ආදායම් වැඩි කර ගැනීමට කටයුතු කරනු ලැබේ. |

### 2.2.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අතුරු ව්‍යවස්ථා ස්ථාපිත කර වරිපනම් බදු අය කිරීම සඳහා කටයුතු කළ යුතුවේ. | අතුරු ව්‍යවස්ථා ස්ථාපිත කර වරිපනම් බදු අයකර යුතු වේ. | වරිපනම් බදු එකතු කිරීම සඳහා විස්තර දැනට එකතු කරමින් පවතී. එය සම්පූර්ණ කළ විගසින් මුළුමනින්ම අයකිරීම සඳහා ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

### 2.2.4 මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ සියළුම බලධාරීන්ගෙන් 2019 ජුනි 30 දිනට රු. 6,986,412ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි. තවද, 2018 ජූලි සිට දෙසැම්බර් 31දින සහ 2019 ජනවාරි සිට දෙසැම්බර් 31දින දක්වා කාලපරිච්ඡේදයට අදාල මුද්දර ගාස්තු ප්‍රාදේශීය සභාව විසින් ගණනය කර රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් නියමිත කාලය තුළ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පසුගිය සහ සමාලෝචිත වර්ෂයේ ආදායම් නියමිත වර්ෂයේදි අයකළ යුතු වේ. | 2018 ජූලි සිට දෙසැම්බර් 31දින සහ 2019 ජනවාරි සිට ජුනි 30 දින දක්වා කාලයට අදාල මුද්දර ගාස්තු ගණනය කර පළාත් ආදායම් බදු දෙපාර්තමේන්තුවට යවා ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) මූලා ප්‍රතිපාදන සලසා නොතිබීම** | | |
| වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව ක්‍රියාත්මක කළ යුතුව තිබූ ක්‍රියාකාරකම් 25 කින් ක්‍රියාකාරකම් 05 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි. අනෙකුත් ක්‍රියාකාරකම් සභාවේ නිර්දේශ අනුව, වෙනස් කර ක්‍රියාත්මක කර තිබුණි. මේ නිසා මහජනතාවට අවශ්‍ය යැයි හඳුනාගෙන යෝජනා කර තිබූ වැඩසටහන් 20ක් ක්‍රියාත්මක කළ නොහැකි වී තිබුණි. | ජනතාවට අවශ්‍ය යැයි හඳුනාගනු ලැබූ යෝජනා කළ වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුවේ. | සභාවේ අරමුදල් සහ නැගෙනහිර පළාත් නිශ්චිත ආධාර වැඩසටහෙනේ අරමුදල් ආදියෙන් ක්‍රියාත්මක කිරීමට පැවැති ක්‍රියාකාරකම් 21 ක් සභාවේ ආදායම් ප්‍රමාණවත් නොවීමත්, නිශ්චිත සංවර්ධන ආධාර අඩුවෙන් ලැබී තිබූ නිසාත් ක්‍රියාකාරකම් 16 ක් ක්‍රියාත්මක කළ නොහැකිව තිබුණි. |
| **(ආ) අරමුණුවලට පටහැනි ක්‍රියාකාරකම්** | | |
| පළාත් නිශ්චිත සංවර්ධන ආධාර (PSDG) අරමුදල් යටතේ 2016 නොවැම්බර් 27 දින රු.1,822,222ක වියදමින් විවේකානන්ද පුරයේ වැටවල් ඉදිකර අපද්‍රව්‍ය රැස්කිරීම සඳහා සකස් කර තිබුණි. එසේ නමුත්, අලීන්ගේ ගැවසීම | වැඩසටහනක් තේරීමේදි එය ලඟාකරගත හැකිද යන්නත් ජනතාවගේ සහයෝගයත්, සැලකිල්ලට ගෙන තෝරා ගැනීම සිදු කළ යුතුවේ. | අප සභාව සතු ඝන අපද්‍රව්‍ය ක්‍රියාකාරිත්වය සඳහා වෙන් කරන ලද විවේකානන්ද පුර යන ගම්මානයේ සිටින ජනතාවගේ විරෝධය හේතුවෙන් ප්‍රාදේශීය ලේකම්වරයාට දැනුම්දීමෙන් අනතුරුව අපට අක්කර 07 ක ඉඩමක් වෙන්කර දුන් අතර දැනට එම ස්ථානයේ |

| | | |
|---|---|---|
| හේතුවෙන් එහි ඉදිකළ වැටවල් හානියට පත්ව් තිබිණි. මෙලෙස අලීන්ගේ හිරිහැර පැවතුණත් ඒවා නොසලකා එම ස්ථානයේම සමාලෝචිත වර්ෂයේ දෙවැනි අදියර සෞඛ්‍ය වැඩසටහන යටතේ රු. 347,342 ක වියදමින් ඝන අපද්‍රව්‍ය රැස්කිරීමේ මධ්‍යස්ථානයක් ස්ථාපිත කර තිබුණි. මෙලෙස මුළුමනින්ම රු.2,169,564 ක් වැය කර තිබුණත්, කිසිදු භාවිතයකින් තොරව පැවැති අතර, අපේක්ෂා කළ අරමුණ ලඟාකර ගැනීමට අවශ්‍ය පියවර ද ගෙන නොතිබුණි. | | අපද්‍රව්‍ය රැස්කිරීම සිදු කෙරේ. ඒවන විටත් වෙන් කළ ස්ථානයේ කොම්පෝස්ට් පොහොර සකස් කිරීමට සුදුසු මෙම ස්ථානයේ පූර්ව අරමුණු සඳහා රු.2,169,564 කට අදාල සේවාවන් අවසන්වී ඇත. ඉදිරි ප්‍රතිපාදන වෙන්කිරීම් මගින් පොහොර නිපදවීමට අවශ්‍ය යන්ත්‍ර මිලදී ගෙන පොහොර නිපදවීමේ කටයුතු සිදු කෙරේ. |

(ඇ) කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන්

-----------------------------

| | | |
|---|---|---|
| දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන යටතේ 2013 වර්ෂයේදී රු. 7,232,236 ක ඇස්තමේන්තුවක් මත සභා බල ප්‍රදේශයේ සින්නවත්තෙයි ගම්මානයේ මහජන පුස්තකාල මහල් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා පළාත් පාලන සහකාර කොමසාරිස්වරයා විසින් කොන්ත්‍රාත්කරුවකු සමඟ 2013 ජනවාරි 31 දින ගිවිසුමකට එළැඹ, අදාල කාර්යය 2013 මැයි 31 දින නිම කළ යුතුව තිබූ නමුත්, සභාවේ අකාර්යක්ෂම වැඩපිළිවෙල හේතුවෙන් රු.1,935,449 ක කාර්යයන් පමණක් අවසන් කර තිබුණි. තවද, පසුගිය හා 2018 වර්ෂයේ පළාත් නිෂ්චිත සංවර්ධන ආධාර අරමුදල් (PSDG), ගුණාත්මක පදනමින් වූ සංවර්ධන ආධාර (CBG), සහ සභා අරමුදල්වලින් මඟින් එකතුව රු.1,021,476 ක් වියදම් කර තිබුණද, මෙම පුස්තකාල ගොඩනැගිල්ල සම්පූර්ණ කර මහජන භාවිතය සඳහා ලබා නොදී වර්ෂ 07 ක් නිෂ්කාර්යව පැවතුණි. | මෙම පුස්තකාල ගොඩනැගිල්ල සම්පූර්ණ කර මහජනතාවගේ උපයෝජනය සඳහා ලබාදිය යුතුවේ. | සින්නවත්තෙයි ගම්මානයේ පිහිටි මහජන පුස්තකාල මහල් ගොඩනැගිල්ලේ වැට හැර අනෙකුත් සියළුම කාර්යයන් අවසන් වි ඇත.එසේ වුවත්, රටේ පවතින අයහපත් වාතාවරණය හේතුවෙන් විවෘත කළ නොහැකි වී ඇත. මෙය කඩිනමින් විවෘත කරනු ලැබේ. |

(ඇ) **ශක්තිමත් කිරීමේ වැඩසටහන**

**-----------------------------------------**

| | | |
|---|---|---|
| ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ 2016 වර්ෂයේදී විවිධ වැඩසටහන් සඳහා වූ කාර්යයන් නිම කළ බවට වාර්තා ඉදිරිපත් කර 2017 වර්ෂයේදී තැන්පත් | ශක්තිමත් කිරීමේ වැඩසටහන් නියමිත වර්ෂවලදී අවසන් විය යුතුව තිබුණි. | වැඩසටහන් සඳහා තැන්පත් කරනු ලැබූ මුදල් මෙම වර්ෂයේ වියදම් කිරීමට කටයුතු කරනු ලැබේ. |

කරනු ලැබූ රු. 1,194,352 සඳහා වූ කාර්යයන් 2020 අප්‍රේල් 29 දින වන විටත් නිම කර නොතිබුණි.

| | | | |
|---|---|---|---|
| (ඉ) | **තිරසාර සංවර්ධන අරමුණු** | | |
| | තිරසාර සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් අදාල කටයුතු මැනිම සඳහා දර්ශකයන් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. | තිරසාර සංවර්ධනය මඟින් ලඟාකරගත යුතු සංවර්ධන වැඩසටහන් න්‍යාය පත්‍රය සම්බන්ධයෙන් මැනිම සඳහා දර්ශකයන් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුවේ. | තිරසාර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම සඳහා දර්ශකයන් ස්ථාපිත කිරීමට කටයුතු කරනු ලැබේ. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **පුරප්පාඩු සහ අතිරික්තයන්** | | |
| i. | තනතුරු 06 කට අදාළව පුරප්පාඩු 11 ක් විය. | පුරප්පාඩු සම්බන්ධයෙන් අවධානය යොමු කර ඒ සඳහා ක්‍රියා මාර්ග ගත යුතුවේ. | අපගේ සභාවේ පවතින කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්බන්ධයෙන් කිහිප අවස්ථාවකදීම අදාල දෙපාර්තමේන්තුවලට ඉල්ලීම් කර තිබුණත් පුරප්පාඩු පුරවා නොතිබුණි. |
| ii. | සභාවට අයත් වාහන 15 ක් සඳහා අනුමත කළ රියැදුරු සංඛ්‍යාව 06 දෙනෙකු වුවත්, තිදෙනෙකු පමණක් සිටින බැවින් පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි. | අතිරික්ත සේවක සංඛ්‍යාව සම්බන්ධයෙන් සභාවේ අවධානය යොමු කර ඒ සඳහා ක්‍රියා මාර්ග ගත යුතුවේ. | අපගේ සභාවේ පවතින කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්බන්ධයෙන් කිහිප අවස්ථාවකදීම අදාල දෙපාර්තමේන්තුවලට ඉල්ලීම් කර තිබුණත් පුරප්පාඩු පුරවා නොතිබුණි. |

## 3.3 ප්‍රසම්පාදනය

**ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළ යුතුවේ. | ප්‍රසම්පාදන සැලැස්මක් ඉදිරි කාලයේදී සකස් කරනු ලැබේ. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ අභ්‍යන්තර විගණන කාර්යයන් සිදු කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන කාර්යයන් ක්‍රියාත්මක කළ යුතුවේ. | අභ්‍යන්තර විගණන කාර්යයන් සමාලෝචිත වර්ෂයේ සිදු කෙරේ. |